# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 49 දරන ජාතික නිවාස (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 ජූලි මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 65 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

**1981 අංක 49 දරන ජාතික නිවාස (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 75/80.

**ජාතික නිවාස පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 49 දරන ජාතික නිවාස (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික නිවාස පනතේ 33 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 401 වන අධිකාරයේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මේ කොටස අදාළ වන යම් නිවාසයක පදිංචිකරු විසින් 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන කවර වූ හෝ අවස්ථාවක, නිවාසයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා සහ නිවාසය පිහිටා තිබෙන ඉඩමෙන් හෝ ස්ථානයෙන් ඒ පදිංචිකරු, ඔහුගේ යැපෙන්නන් හා ඒ ඉඩමෙහි හෝ ස්ථානයෙහි නැතහොත් ඉන් කොටසක හෝ පදිංචිව සිටින වෙනත් සෑම තැනැත්තකු ම ඉවත් කිරීම සඳහා අයැදිමින්, ඉඩම් හිමියා විසින්, නිවාසය පිහිටා තිබෙන්නා වූ දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ සෑම ඉල්ලීමක් ම, පදිංචිකරුගේ පදිංචිය අවසන් වන කාලය හා ආකාරය දක්වන්නාවූ දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" අභියාචන. 36. මේ කොටස යටතේ දිසා අධිකරණය විසින් ප්‍රකාශ කරන ලද නැතහොත් කරන ලද යම් අවසාන නඩු තීන්දුවකින් හෝ අවසාන නඩු තීන්දුව ලෙස බලපෑමක් ඇති යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ නඩු තීන්දුව ප්‍රකාශ කරන ලද හෝ ආඥාව කරන ලද දින සිට (ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර) දින දහතරක කාලයක් ඉකුත් වීමට පෙර, ඒ නඩු තීන්දුවට හෝ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය;

2—ඒ56783—14,875 (81/06)

තව ද, දිසා අධිකරණයේ නඩු තීන්දුවලට හෝ ආඥාවලට විරුද්ධව අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනවලට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කරනු ලබන යම් අභියාචනයක් සම්බන්ධයෙන්, අදාළ විය යුතු ය.".

අතීතයට බලපෑම.

4. මේ පනතේ 2 වන හා 3 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්ති යට කරන ලද සංශෝධන, 1979 ජූලි මස 2 වන දින සිට බලාත්මක වූ සේ සලකනු ලැබිය යුතු ය.

1979 ජූලි 2 වන දින හා මේ පනත ආරම්භ වන දින අතර මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ ඉල්ලීම් ආදිය වලංගු බව.

5. (1) 1979 ජූලි මස 2 වන දින ආරම්භව, මේ පනත ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙන් අවසන් වන කාලය ඇතුළත, ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටස යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත කරන ලද කිසිම ඉල්ලීමක් හෝ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද නැතහොත් කරන ලද කිසිම අවසාන නඩු තීන්දුවක් හෝ අවසාන නඩු තීන්දුවක් ලෙස බලපෑම ඇති කිසිම ආඥාවක්, ඒ ඉල්ලීම මහේස්ත්‍රාත් අධිකරණයක් වෙතට කරනු ලැබීමේ හෝ අවසාන නඩු තීන්දුව නැතහොත් අවසාන නඩු තීන්දුවක් ලෙස බලපෑම ඇති ආඥාව මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබීමේ හෝ කරනු ලැබීමේ හේතුව නිසාම පමණක්, අවලංගු විය යුතු සේ හෝ අවලංගු වූ සේ සලකනු නොලැබිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටස යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත කරනු ලැබ, මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඒ අධිකරණයේ විනිශ්චයට භාජනව පවත්නා සෑම ඉල්ලීමක් ම, මේ පනත ආරම්භ වන දින සිට, ඒ මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙතට ඉවත් කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.

(3) 1979 ජූලි මස 2 වන දින ආරම්භව, මේ පනත ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙන් අවසන් වන කාලය ඇතුළත ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටස යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද හෝ කරන ලද සෑම අවසාන නඩු තීන්දුවක් ම නැතහොත් අවසාන නඩු තීන්දුවක් ලෙස බලපෑම ඇති සෑම ආඥාවක් ම, සියලු කාර්ය සඳහා, මේ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටස යටතේ දිසා අධිකරණය විසින් ප්‍රකාශ කරන ලද හෝ කරන ලද අවසාන නඩු තීන්දුවක් නැතහොත් අවසාන නඩු තීන්දුවක් ලෙස බලපෑමක් ඇති ආඥාවක් විය යුතු ලෙස නැතහොත් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය; නැතහොත් බලාත්මක කරනු ලැබිය හැකි ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.